# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 32 දරන
# සංවර්ධන සභා (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1982 සැප්තැම්බර් මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 සැප්තැම්බර් මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී**

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ගත හැක**

**මිළ : ශත 45 යි** **තැපැල් ගාස්තුව : ශත 50 යි**

**1982 අංක 32 දරන සංවර්ධන සභා (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1982 සැප්තැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 30/82

**1980 අංක 35 දරන සංවර්ධන සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—**

1. මේ පනත 1982 අංක 32 දරන සංවර්ධන සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1980 අංක 35 දරන සංවර්ධන සභා පනතෙහි (1981 අංක 45 දරන පනතින් ඇතුළත් කරන ලද) 17 අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1980 අංක 35 දරන පනතේ 17 අ වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(3අ) සෑම ග්‍රාමෝදය මණ්ඩලයක් ම අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ගිවිසුම්වලට එළඹීමට ඊට බලය තිබිය යුතු ය. තවද එය පිහිටුවනු ලැබුවේ යම් ප්‍රදේශයක් සඳහා ද ඒ ප්‍රදේශයේ ග්‍රාමෝදය මණ්ඩලය යන නාමයෙන් හා අභිධානයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(3ආ) ග්‍රාමෝදය මණ්ඩලයේ පොදු මුද්‍රාව—

(අ) ග්‍රාමෝදය මණ්ඩලයේ ලේකම්වරයා භාරයෙහි තිබිය යුතු ය ; තවද

(ආ) යම් ගිවිසුමකට හෝ වෙනත් සාධන පත්‍රයකට තැබීමේදී ග්‍රාමෝදය මණ්ඩලයේ අනුමතය ඇතිව ද තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ ගිවිසුමට හෝ වෙනත් සාධන පත්‍රයට තමන්ගේ නම් අත්සන් කළ යුතු ග්‍රාමෝදය මණ්ඩලයේ සභාපතිවරයා සහ ලේකම්වරයා ඉදිරිපිට දී ද හැර ඒ මුද්‍රාව තබනු නොලැබිය යුතු ය.

(3ඇ) සෑම ග්‍රාමෝදය මණ්ඩලයක් ම විසින්, ඒ ග්‍රාමෝදය මණ්ඩලය පිහිටුවනු ලැබ ඇත්තේ යම් ප්‍රදේශයක් සඳහා ද ඒ ප්‍රදේශය ඇතුළත, මේ පනතින් හෝ මේ පනත යටතේ නැතහොත් වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ ඒ ග්‍රාමෝදය මණ්ඩලය වෙත පවරා ඇති, නියම කර ඇති හෝ වෙන්කර දී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීම හෝ කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීම කළ යුතු අතර, සංවර්ධන සභාවක් විසින්, සංවර්ධන සභාවක විධායක කමිටුව විසින් හෝ දිසා ලේකම්වරයා විසින් මේ පනත යටතේ ඒ ග්‍රාමෝදය මණ්ඩලය වෙත, පවරන ලද යම් කාර්යයක් ද කළ යුතු ය.

2—ජේ 66040—15,100 (82/09)

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුලත් කිරීමෙන් :—

"(5අ) සෑම ප්‍රාදේශීය මණ්ඩලයක් ම අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ගිවිසුම්වලට එළඹීමට ඊට බලය තිබිය යුතුය. තවද එය පිහිටුවනු ලැබුවේ යම් ප්‍රදේශයක් සඳහා ද ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය මණ්ඩලය යන නාමයෙන් හා අභිධානයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(5ආ) ප්‍රාදේශීය මණ්ඩලයේ පොදු මුද්‍රාව—

(අ) ප්‍රාදේශීය මණ්ඩලයේ ලේකම්වරයා භාරයෙහි තිබිය යුතුය; තවද

(ආ) යම් ගිවිසුමකට හෝ වෙනත් සාධන පත්‍රයකට තැබීමේ දී, ප්‍රාදේශීය මණ්ඩලයේ අනුමතය ඇතිව ද තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ ගිවිසුමට හෝ වෙනත් සාධන පත්‍රයට තමන්ගේ නම් අත්සන් කළ යුතු ප්‍රාදේශීය මණ්ඩලයේ සභාපතිවරයා සහ ලේකම්වරයා ඉදිරිපිට දී ද හැර ඒ මුද්‍රාව තබනු නොලැබිය යුතු ය.

(5ඇ) සෑම ප්‍රාදේශීය මණ්ඩලයක් ම විසින්, ඒ ප්‍රාදේශීය මණ්ඩලය පිහිටුවනු ලැබ ඇත්තේ යම් ප්‍රදේශයක් සඳහාද ඒ ප්‍රදේශය ඇතුළත, මේ පනතින් හෝ මේ පනත යටතේ නැතහොත් වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ ඒ ප්‍රාදේශීය මණ්ඩලය වෙත පවරා ඇති, නියම කර ඇති හෝ වෙන් කර දී ඇති යම් බලයක්, ක්‍රියාත්මක කිරීම හෝ කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීම කළ යුතු අතර, සංවර්ධන සභාවක් විසින්, සංවර්ධන සභාවක විධායක කමිටුව විසින් හෝ දිසා ලේකම්වරයකු විසින් මේ පනත යටතේ ඒ ප්‍රාදේශීය මණ්ඩලය වෙත පවරන ලද යම් වැඩක් ද කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි "තවද ඒ අනුව ඒ ආඥාපනත්වල හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ යම් සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් සම්බන්ධයෙන් කරන ලද යම් සඳහනක් සංවර්ධන සභාවක් සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය;" යන වචන වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"තවද ඒ අනුව ඒ ආඥාපනත්වල හෝ වෙනත් යම් ලිඛිත නීතියක—

(i) යම් සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් සම්බන්ධයෙන් කරන ලද යම් සඳහනක් සංවර්ධන සභාවක් සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස ද;

(ii) සුළු නගර සභාවක යම් සභාපතිවරයකු හෝ ගම් සභාවක යම් සභාපතිවරයකු සම්බන්ධයෙන් කරන ලද යම් සඳහනක් සංවර්ධන සභාවක විධායක කමිටුව හෝ ඒ විධායක කමිටුව විසින් යෝජනා සම්මතයක් මගින් තත් කාර්යය සඳහා බලය දී ඇති යම් තැනැත්තකු හෝ තැනැත්තන් හෝ සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස ද

සලකනු ලැබිය යුතුය;".

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියට කරන ලද සංශෝධනය ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙහි බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ, 1981 මැයි මස 28 වන දින අංක 142/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමය, මේ වගන්තියේ (1) වන උපවගන්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයට අදාළ විය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ "වෙනත් නිලධරයන් දෙදෙනකු" යන වචන වෙනුවට "වෙනත් එක් නිලධරයකු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 36අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එහි 36අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"විධායක කමිටුව විසින් එහි බලතල ආදිය පැවරිය හැකි බව.

36අ. (1) මේ පනතින් හෝ මේ පනත යටතේ නැතහොත් වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ සංවර්ධන සභාවක විධායක කමිටුවක් වෙත පවරා ඇති, නියම කර ඇති හෝ වෙන් කර දී ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක්, සංවර්ධන සභාවේ අනුමතයට යටත්ව, යෝජනා සම්මතයක් මගින් ඒ විධායක කමිටුව විසින් ඒ සංවර්ධන සභාවේ යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි ය.

(2) සංවර්ධන සභාවක විධායක කමිටුව විසින් යෝජනා සම්මතයක් මගින් සංවර්ධන සභාවක නිලධරයකුට පවරා ඇති යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ඒ නිලධරයා විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම, යෝජනා සම්මතයෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට හා සීමාකිරීම්වලට යටත් විය යුතු අතර, එසේ සඳහන් කරනු ලැබිය හැකි යම් කාර්යයකට හෝ කාර්යයන්ට සීමා විය යුතු ය. තවද එවැනි යම් පැවරීමක් විධායක කමිටුවේ යෝජනා සම්මතයක් මගින් කවර හෝ වේලාවක වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කළ හැකි ය.

(3) සංවර්ධන සභාවක විධායක කමිටුව විසින්, ඒ සංවර්ධන සභාවේ යම් නිලධරයකුට යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් පවරනු ලැබුව ද, එසේ වූ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටුකිරීමට ඒ විධායක කමිටුවට හිමිකම තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 48අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එහි 48අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"දිසා ලේකම්වරයා විසින් තමාගේ බලතල ආදිය පැවරිය හැකි බව.

48අ. (1) මේ පනතින් හෝ මේ පනත යටතේ නැතහොත් වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ සංවර්ධන සභාවක දිසා ලේකම්වරයා වෙත පවරා ඇති, නියම කර ඇති හෝ වෙන් කර දී ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක්, සංවර්ධන සභාවේ සහ එහි විධායක කමිටුවේ අනුමතයට යටත්ව, ලිය විල්ලකින් වූ සාමාන්‍ය හෝ විශේෂ නියමයක් මගින් ඒ සංවර්ධන සභාවේ දිසා ලේකම්වරයා විසින් ඒ සංවර්ධන සභාවේ යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි ය.

(2) සංවර්ධන සභාවක දිසා ලේකම්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් මගින් සංවර්ධන සභාවක නිලධරයකුට පවරා ඇති යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ඒ නිලධරයා විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම එවැනි යම් නියමයක සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට හා සීමාකිරීම්වලට යටත් විය යුතු අතර එසේ සඳහන් කරනු ලැබිය හැකි යම් කාර්යයකට හෝ කාර්යයන්ට සීමා විය යුතු ය. තවද එවැනි යම් පැවරීමක් දිසා ලේකම්වරයාගේ නියමයක් මගින් කවර හෝ වේලාවක වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කළ හැකි ය.

(3) සංවර්ධන සභාවක දිසා ලේකම්වරයා විසින්, ඒ සංවර්ධන සභාවේ යම් නිලධරයකුට යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් පවරනු ලැබුව ද, එසේ වූ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටුකිරීමට දිසා ලේකම්වරයාට හිමිකම තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(8) යම් තැනැත්තකුගෙන් යම් සුළු නගර සභාවකට හෝ ගම් සභාවකට ලැබිය යුතු බවට යම් දිසාපතිවරයකු විසින් සහතික කරන ලද යම් මුදලක් ම, ඒ සුළු නගර සභාව හෝ ගම්

සභාව පිහිටියේ යම් සංවර්ධන සභාවක් ඇතුළත ද ඒ සංවර්ධන සභාවේ දිසා ලේකම්වරයා විසින්, මේ වගන්තියේ ඉහතින්වූ විධිවිධානවල දක්වා ඇති ආකාරයෙන් අය කර ගනු ලැබිය යුතු ය.".

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියට කරන ලද සංශෝධනය, ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙහි බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, මේ වගන්තියේ (1) වන උපවගන්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියේ විධිවිධාන, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමට පෙර සුළු නගර සභා ආඥා පනත හෝ ගම් සභා ආඥාපනත යටතේ කරන ලද යම් අධිභාරයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— *ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(1) ඒ වගන්තියේ "රුපියල් පන්දහසකට" යන වචන වෙනුවට, "රුපියල් පනස් දහසකට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "රුපියල් පන්දහසක්" යන වචන වෙනුවට "රුපියල් පනස්දහසක්" යන වචන ආදේශ කිරීමෙන්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— *ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(1) ඒ වගන්තියේ "රුපියල් පන්දහසකට" යන වචන වෙනුවට "රුපියල් පනස්දහසකට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "රුපියල් පන්දහසක්" යන වචන වෙනුවට "රුපියල් පනස්දහසක්" යන වචන ආදේශ කිරීමෙන්.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එහි 75 අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:— *ප්‍රධාන ප්‍රඥප්තියේ 75 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

*"බදු නොවන මුදල් අත්හැරීම.*

75අ. අත්හැරීමට ඇති මුදල් ප්‍රමාණය ඉතා සුළු බව හෝ අයකර ගත නොහැකි බව හෝ එය ගෙවීමට යටත් තැනැත්තා දිළිඳු වීමේ හේතුවෙන් එය කපා හැරිය යුතු බව සංවර්ධන සභාවකට පෙනී යන්නේ නම්, යම් තැනැත්තකුගෙන් සභාවට ලැබිය යුතු වූ (අත්හැරීම සඳහා 75 වන වගන්තියෙන් විධිවිධාන සලසා ඇති මුදලක් නොවන) යම් මුදලක් සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් හෝ ඒ සභාව විසින් යෝජනා සම්මතයක් මඟින් අත්හැරිය හැකි ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.